**අරණායක ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අරණායක ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට **අරණායක** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය හා ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂයට වඩා රු.19,111,148ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | භාණ්ඩ සමීක්ෂණය අනුව උස්සාපිටිය හා අරණායක මහජන පුස්තකාල පොත් වටිනාකමට වඩා රු.109,993 ක් වැඩියෙන් එම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පරිග්‍රහණ ලේඛන පරීක්ෂා කර ඉදිරියේ දී නිවැරදි කරන බව | එම - |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා ඊට අදාළ අනුරූපී වාර්තා අනුව එම ශේෂය අතර රු.6,190,443ක වෙනසක් පැවතිණි. | පැරණි ශේෂ බැවින් වෙනස සොයාගත නොහැකි විම. | නොසැසඳීම සැසඳිය යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.27,670,079ක ජංගම නොවන වත්කම් වෙනුවෙන් උපලේඛන ඉදිරිපත් නොවුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව | ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 571 | නිරවුල් නොකළ රු.700,020 ක වර්ෂ 02 ඉක්මවූ තැන්පතු 44 ක් ආදායමට ගෙන නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,255,358 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 3,733,416 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම. | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,380,628 | 2,326,003 | 2,800,541 | 247,236 | 2,478,270 | 2787,555 | 2,665,911 | 326,136 |
| කුලී | 6,674,950 | 1,416,940 | 3,198,482 | 3,000 | 4,632,500 | 3,376,427 | 3,375,962 | 147,441 |
| බලපත්‍ර ගාස්තු | 773,170 | 1,113,111 | 967,852 | 111,490 | 408,564 | 560,910 | 554,910 | 9,000 |
| වෙනත් ආදායම් | 87,165,382 | 4,348,330 | 5,247,056 | 44,939 | 3,101,200 | 4,483,650 | 3,707.597 | 61,904 |
| එකතුව | 96,994,130 | 9,204,384 | 12,213,931 | 406,664 | 10,620,534 | 11,208,542 | 6,600,491 | 544,481 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපාර සමීක්ෂණය අනුව 2023 වර්ෂයේදී ව්‍යාපාර 419 ක් හඳුනාගෙන තිබුණද, ව්‍යාපාර බදු ලේඛනය අනුව ආයතන 1314 කින් බදු මුදල් ලැබී තිබුණි. ඒ අනුව ව්‍යාපාර ඒකක 895 ක් හඳුනා නොගැනීම නිසා ව්‍යාපාර සමීක්ෂණයේ නිවැරදිතාව ප්‍රශ්ණගත විය. | ඉදිරියේ දී එකී අඩුපාඩු මගහරවා ගනිමින් කටයුතු කරන බව | නිවැරදිව ව්‍යාපාර සමීක්ෂණය කර බදු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහජන විරෝධතා නිසා තෝරාගත් ඉඩමේ කොම්පෝස්ට් අංගනය ඉදිකර නොතිබුණි. ඒ වෙනුවට රු.1,076,500 ක වාර්ෂික බදු පදනම මත ලබාගත් පෞද්ගලික ඉඩමකට කසළ බැහැර කර තිබුණි. 2023 වර්ෂයේ කසළ කළමනාකරණය වෙනුවෙන් රු.8,395,458 ක වැයකර තිබුණ ද, කසළවලින් පොහොර නිෂ්පාදනය කර නොතිබුණි. | මහජන විරෝධතා හේතුවෙන් කසළ බැහැර කිරිමට නොහැකි විය. බදු ඔප්පුව ලියාපදිංචි වි නොමැති බැවිත් ඉදිකිරිම් කිරිමට නොහැකි වූ බවත්, එක්රැස්වන පොලිතින් බ්‍රේල් කරන බව. | කසළ කළමනාකරණය විධිමත් පරිදි සිදු කළ යුතු වේ. |

### 3.2 මෙහෙයුම් ආකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන වීථි පහන් 764 ස්ථාපිත කර තිබුණි. | අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කටයුතු කරමි. | අදාළ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ආ) | දිප්පිටිය පොදු වෙළඳපොළ සංකීර්ණයේ ඉදි කිරීම් වැඩ අවසන් කර වසරකට අධික කාලයක් ගත වී ඇතත්, විදුලිය නොමැති වීම හේතුවෙන් විවෘත කර නොතිබුණි. | පොදු වෙළඳ සංකීර්ණය විවෘත කිරීම සඳහා ප්‍රමාදයට හේතුව විදුලිය නොමැති වීම බවත්, | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 77 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු 13 ක් පැවති අතර 10 දෙනෙකුගේ අතිරික්තයක් විය. ඒ හැර සේවා ගිවිසුම් මත හා දරන්නාට පෞද්ගලික වනසේ තනතුරු 10ක් අනුමත කර තිබුණි. | කළමනාකරණ සේවා චක්‍ර ලේඛ විධිවිධාන අනුව හා නව කාර්ය මණ්ඩල අනුමත කිරිමට හෝ නව බඳවා ගැනීම් සිදු කිරිමට හැකියාවක් නොමැති බවත් | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු නොවූ රු.426,128 ක් වූ ට්‍රැක්ටරය හා ටේලරයක හිමිකාරීත්වය පවරා ගෙන නොතිබුණි. | අබලි තත්ත්වයේ ඇති ට්‍රැක්ටරය හා ට්‍රේලරයේ ලියාපදිංචි අයිතිය ලද පසු වෙන්දේසි කරන බව | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු රු.9,310,730 ක් වූ වාහන 04 ක් ටේලර් 03 ක් 2018, 2019 හා 2021 වර්ෂ වල සිට අභාවිතව පැවතුණි. | ට්‍රේලරයක් අපහණයට නිර්දේශිත බවත් ඉතිරි වාහන 03 සහ ට්‍රේලර් 02 අලුත්වැඩියා කර භාවිතයට ගන්නා බව | - එම - |
| (ඇ) | අක්කර 18 : පර්චස් 18.82 ක් වූ සභාවට අයත් සුසාන භූමි 23 ක අයිතිය පවරාගෙන තක්සේරු කර වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. සුසාන භූමිවල මායිම් ආරක්ෂා කර නොතිබුණු අතර සුසාන භූමිවල කටයුතු විධිමත් කිරීමට අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි. එමෙන්ම, සුසාන භූමි 22 ක පවතින වටිනා ගස් හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. | තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බවත් ඉදිරියේදි වැට මායිම් නිරවුල් කර සුසාන භූමි ගැසට් කරන බවත් සුසාන භූමිවල පවතින වටිනා ගස් ලේඛනගත කරන බවත් | වත්කම් ආරක්ෂා කර ගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |